# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,745 — 1959 මැයි 20 වැනි බදාදා—20.5.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැළපෙන පරිද්දෙනි)


| | | | | | |
|---|---|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන | ... | පිට | රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | ... | පිට |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් | ... | — | ආණ්ඩුවේ නිවේදන්... ... | ... | 1271 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | 1269 | මිළ පාලන දැන්වීම් ... ... | ... | — |
| අධිකරණසේවාකොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | 1269 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | ... | — |
| වෙනත් පත් කිරීම් ... ... | ... | 1271 | "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් | ... | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 211**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ගත්තේ ය :—

ඒ. 108/59.

1959 අප්‍රියෙල් මස 24 වැනි දින සිට, ආහාර කොමසාරිස් ජේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා (සී. සී. ඇස්.) දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහිර ලේකම් කේ. අල්වාපිල්ලේ මහතා (ඕ. බී. ඊ.), සවකීය රාජකායයීවලට අතිරේකව, ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 108/59.

1959 අප්‍රියෙල් මස 23 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහිර ලේකම් කේ. අල්වාපිල්ලෙයි මහතා (ඕ. බී. ඊ.) සවකීය රාජකාරිලවට අතිරේකව සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර වශයෙන් වැඩ බැලීමට.

ඒ. 109/59.

1959 මාර්තු මස 24 වැනි දින සිට, ඩී. ආර්. ඇල්. බාලසූරිය මහතා (සී. සී. ඇස්.) නිවාඩු පිට සිටින කාලය තුළ, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ඩී. සී. ඇල්. අමරසිංහ මහතා (සී. සී. ඇස්.) සවකීය රාජකාරිවලට අතිරේකව, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 226/58.

1959 මාර්තු මස 26 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ඇම්. ජේ. පෙරේරා මහතා (සී. සී. ඇස්.), සවකීය රාජකාරිවලට අතිරේකව, රජයේ ලලිත කලායතනයේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 99/59.

1959 මාර්තු මස 14 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, පී. රාජතුරෙයි මහතා (සී. සී. ඇස්.), තේ අපනයන කොමසාරිස් වශයෙන්.

ඒ. 64/59.

1959 අප්‍රියෙල් මස 17 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ඒ. රත්නම් මහතා (සී. සී. ඇස්.) රේගුවේ නියෝජ්‍ය අයකැමි සහ කොළඹ ගොඩබෑම් සමීක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 150/59.

1959 අප්‍රියෙල් මස 23 වැනි දින සිට, බී. ආර්. දේවරාජන් මහතා (සී. සී. ඇස්.) දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ අලෙවි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් ඇල්. බී. රාජකරුණා මහතා සවකීය රාජකාරිවලට අතිරේකව අලෙවි කිරීමේ කොමසාරිස් තනතුරට අයත් වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මැයි මස 16 වැනි දින,
තැ. පෙ. 500.
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා කායයීාලයේ දීය.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 212**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑ්ඒ. 46/48.

එෆ්. ඊ. ඇලස් මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මැයි 12 වැනි දින, හැටන් දිස්ත්‍රික් උසාවියේ අංක සී/4,608 නඩුවේ තීන්දුව දීමට, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ්ඒ. 21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා, ඔහුගේ වෙනත් රාජකාවලට අතිරේක වශයෙන්, 1959 මැයි 29 වැනි දින, නාවලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,314 නඩුව ඇසීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ්ඒ. 56/48.

වී. කේ. කන්දසාමි මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මැයි 15 වැනි දින, ත්‍රිකුණාමලයේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 22,830 හා 23,240 නඩු ඇසීමට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : සීජේඑම්. 14/52.

ඒ. විජේරත්න මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මැයි 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : සීජේඑම්. 14/52.

ඒ. විජේරත්න මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1959 මැයි 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : සීජේඑම්. 14/52.

ඒ. විජේරත්න මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවරට අතිරේක වශයෙන්, 1959 මැයි 10 වැනි දින පටන්, නැවත නියමයකා කරන තුරු මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 6බී/48.

ඊ. බී. එස්. කොරෙයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1959 මැයි 11 වැනි දින පටන් 14 වැනි දින දක්වා හා 1959 මැයි 15 වැනි දින පටන් 19 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1959 මැයි 20 වැනි දින පටන් 25 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 5ඒ/55.

ඒ. ඊ. බුල්ජන්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩී. රත්නතුංග මහතා 1959 මැයි 19 වැනි දින පටන් 25 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 1/48.

ඩබ්ලිව්. ඊ. අබේකෝන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම් එම්. කාසිම් මහතා 1959 මැයි 7 වැනි දින පටන් 11 වැනි දින දක්වා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1/48.

ඩබ්ලිව්. ඊ. අබේකෝන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1959 මැයි 8 වැනි දින හලාවත හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා හලාවත අතිරේක මහෙස්ත්‍රත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 33ඒ/53.

වී. කේ. කන්දසාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. නටරාජා මහතා 1959 මැයි 15 වැනි දින පටන් 25 වැනි දින දක්වා, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. අමරසිංහ මහතා 1959 මැයි 8 වැනි දින පටන් 10 වැනි දින දක්වා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 37ඒ/53.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1959 මැයි 9 වැනි දින පටන් 11 වැනි දින දක්වා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. වී. එස්. ද සිල්වා මහතා 1959 මැයි 11 වැනි දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 53ඒ/58.

කේ. ඒ. පී. රණසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඕ. එම්. එල්. පින්ටු මහතා 1959 මැයි 20 වැනි දින පටන් 25 වැනි දින දක්වා රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1959 මැයි 18 වැනි දින මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එසුරපාඩිහම් මහතා 1959 මැයි 9 වැනි, 11 වැනි, 12 වැනි, 16 වැනි, 18 වැනි හා 19 වැනි දිනයන්හි පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49/48

එස්. එන්. රාජදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1959 මැයි 13 වැනි දින පටන් 15 වැනි දින දක්වා හා 20 වැනි දිනද, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ්ඒ. 45/48.

ටී. පී. සී. කැරන් මහතා 1959 මැයි 15 වැනි දින මීගමුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 94,165 නඩුවේ තීන්දුව දීමට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ්ඒ. 21/48.

ටී. බී. යටවර මහතා 1959 මැයි 29 වැනි දින ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 6,155 නඩුව ඇසීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, ගම්පොල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68බී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1959 මැයි 30 වැනි දින පටන් 1959 ජූනි 4 වැනි දින හා 22 වැනි දින කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නවත නියමයක් කරන තුරු, ඒ. සිමාම්පිල්ලේ මහතා 1959 මැයි 10 වැනි හා 11 වැනි දිනයන්හි, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්අයි. 3/48.

ඩබ්ලිව්. බී. ඉබුල්දෙණිය මහතා නැති අතර, ටී. බී. ඉලංගන්තිලක මහතා 1959 මැයි 8 වැනි හා 9 වැනි දිනයන්හි, මහනුවර දිස්ත්‍රික්කයේ උඩු නුවර, උඩ පළාත, උඩ බුලත්ගම හා යටිනුවර ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 2/48.

සී. ඒ. රත්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. සේනානායක මහතා 1959 මැයි 11 වැනි සහ 12 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයනේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ්ඒ. 22/57.

ඩී. සේරසිංහ මහතා 1959 මැයි 20 වැනි දින අම්බලන්තොට ගම්බද උසාවියේ අංක සීආර්එම් 3,526 හා 3,567 නඩු ඇසීමට තංගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා හා මාගම් පත්තු ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, ඩී. සේරසිංහ මහතා 1959 මැයි 23 වැනි දින, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 1/50.

වී. නල්ලසේගරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආර්. රාජේන්ද්‍රා මහතා 1959 මැයි 11 වැනි හා 12 වැනි දිනයන් හි, යාපනේ දිස්ත්‍රික්කයේ උතුරු හා නැගෙනහිර වලිකාමම්, වඩමරාඩ්චි හා යාපනේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මැයි 15 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායසීලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1959 අංක 213**

අංකය : ඕ. ඇම්. 4/1/11 ඇf ජ් 11.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු 'කිරීම දැනුම් දී ඇති දිනයෙහි සිට බල පැවැත්වේ:—

1959 අප්‍රේල් මස 27 වැනි දින සිට නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ සිව් වැනි පෙළේ වයි. දුරෙයිස්වාමි මහතා, කැන්බරාහි ලංකා මහ කොමසාරිස් කාර්යාලයයේ දෙවැනි ලේකම් හැටියට.

ජී. ද සොයිසා.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්.

1959 මැයි මස 11 වැනි දින,
කොළඹ 1, උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලේදීය.

**1959 අංක 214**

අංකය : ඒ. සී. 27/1/59.

දිව්රුම් සම්බන්ධ ආඥාපනතේ 12 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 මැයි මස 5 වෙනි දින සිට එම්. එම්. ගුණතිලක මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස් වරයෙකු වශයෙන් ද,

1959 මැයි මස 6 වෙනි දින සිට එම්. ටී. ටී. ද එස්. අමරසේකර මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයෙකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 අප්‍රේල් මස 26 වෙනි දින සිට, ඩබ්ලිව්. එල්. ජී. ජයසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එස්. මනනායක මහතාද,

1959 අප්‍රේල් මස 26 වෙනි දින සිට, ඩබ්ලිව්. තල්දෙන මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ ඔයපලාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. බී. රත්නායක මහතාද,

1959 අප්‍රෙල් මස 29 වෙනි දින සිට, ජේ. එම්. සහාරත්නම් මහතා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජී. පී. එච්. ද සිල්වා මහතාද,

1959 අප්‍රෙල් මස 29 වෙනි දින සිට, ජේ. එම්. සහාරත්නම් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ කරවකු සහ නින්තවූර් පත්තුවල ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී ධුරය දරණ කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. එල්. පැට්රික් මහතාද,

1959 මැයි මස 2 වෙනි දින සිට, ඒ. කන්දයියා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී ධුරයෙහි වැඩබලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එක්ස්. එම්. සෙල්ලතම්බු මහතාද,

1959 මැයි මස 5 වෙනි දින සිට, එස්. එම්. අබේරත්න මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැගෙනහිර දඹදෙනි උඩුකහ කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එච්. බී. සමරකෝන් මහතාද,

1959 මැයි මස 6 වෙනි දින සිට, පී. ඒ. වනසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. පී. එස්. විජේතුංග මහතාද.

1959 මැයි මස 7 වෙනි දින සිට, රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරලේ හෙලපල්ල පළාතේ හදිසි මරණ පරීක්ෂක ධුරයට එස්. එම්. ටී. බී. මීගස්දෙනිය මහතාද,

1959 මැයි මස 9 වෙනි දින සිට, පී. එච්. එම්. පී. බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපලාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. ඩබ්ලිව්. විල්සන් සිල්වා මහතාද,

1959 මැයි මස 13 වෙනි දින සිට, පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ, අක්කරෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී ධුරයෙහි වැඩබලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට බී. ඒ. ජේ. කාසිනාඩර් මහතාද,

පත් කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන සථිර ලේකම්.

1959 මැයි මස 16 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

**1959 අංක 215**

ලංකා සිවිල් සේවයේ ඒ. රත්නම් මහතා 1959 අප්‍රියෙල් මස 17 වෙනි දින සිට නැව් කැඩීයාමෙන් ඉතිරි වූ දේවල් හා ගොඩගත් දේවල් පිළිබඳ ආඥාපනතේ (පරිඡේද 267) 2 වැනි වගන්තිය Section 2 of Wreck and Salvage Ordinance (Cap.267) යටතේ නැව් කැඩීයාමෙන් විනාශ වී ඉතිරිවූ දේ පිළිබඳ කොළඹ දිස්ත්‍රික්කයේ භාරගන්නා නිලධාරියා (Receiver of Wrecks for the District of Colombo) වශයෙන්, වාණිජ හා වෙළඳ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබ සිටි.

[Section 2 of Wreck and Salvage Ordinance (Cap. 267)]

එල්. එස්. බී. පෙරේරා
ස්ථිර ලේකම්.

1959 මැයි මස 11 වැනි දින,
කොළඹ, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ දීය.

**1959 අංක 216**

වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1959 අප්‍රියෙල් මස 17 වෙනි දින සිට, නියෝජ්‍ය රේගු අයකැමි සිවිල් නිලධාරී ඒ. රත්නම් මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, සහකාර ආනයන හා අපනයන පාලක කෙනෙකු වශයෙන් පත් කරන ලදී.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1959 මැයි මස 12 වැනි දින,
කොළඹ දීය.

# ආණ්ඩුවේ නිවේදන

කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඉන්ද්‍රානී ජයතිලක මහත්මියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 මැයි මස 11 වැනි දින,
කොළඹ දීය.

මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් පාමෙන් කුඩා තිත්තවෙල මහතා විසින් නොතාරිස් ආඥාපනතේ (91 වන පරිච්ඡේදයේ) 21 (1) වගන්තිය යටතේ 1959 මාර්තු මස 1 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරණ ලදුව, ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 මැයි මස 4 වැනි දින,
කොළඹ දීය.

ජාතික පුස

## 4 බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහ වැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි. විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන.

1959 මැයි මස 16 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම් කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| I 5741—27.7.51 .. | මුත්තුවීරන් රාමසාමි, අංක 61, ග්‍රීන් හවුස්, වටවල | නාගම්මා නොහොත් නල්ලම්මාල් (භාය්‍යාව), දවමනි (දුව) |
| J 10685—15.5.51 .. | වෙල්ලසාමි පෙරුමාල්, මස්කෙළිය වත්ත, මස්කෙළිය | අන්නම්මාල් (භාර්යාව), පූපති (දුව), ජයලෙච්චිමි (දුව) |
| J 10758—4.8.51 .. | වීරප්පන් වෙල්ලාය නායිදු, ලක්‍ෂපානගල්ල කොටස, තර්බර්ටන් වතුයාය, නෝටන්බ්‍රිජ් | ලෙච්චිමිඅම්මාල් (භාර්යාව), ක්‍රිෂ්නරාජ් (පුතා), කන්නම්මාල් (දුව) |
| J 10766—30.7.51 .. | කාලිමුත්තු ක්‍රිස්ටියන්, කැස්කිබන් වත්ත, මස්කෙළිය | සවරිඅම්මා (භාර්යාව), ගාබ්‍රියෙල් නොහොත් ගෝපාල් (පුතා), ජෙබමාලෙයි නොහොත් සෝමාලමාරි (දුව), විලාසර් නොහොත් ලාසාරස් (පුතා), මදලමාරි (දුව), මේරි (දුව) |
| J 10843—4.8.51 .. | පෙරියන්නන් පෙරිය ආන්ඩි, පහළ කොටස, සාන්ත ජෝන් ඩෙල්රේවත්ත, නෝර්වුඩ් | වේලායි නොහොත් වේලම්මාල් (භාර්යාව) |
| J 10920—30.7.51 .. | ඥානමුත්තු මුත්තිරි, මහනිලූ වත්ත, අප්කොට් ... | වල්ලිඅම්මෙයි (භාර්යාව), සිරුවාමනි (දුව), පාකියම් (දුව), ලීලාවති (දුව) |
| J 11068—5.8.51 .. | නල්ලන් පකිරි, කැස්කිබන් වත්ත, මස්කෙළිය ... | ලෙච්චුමි (භාය්‍යාව), සිවපාකියවති (දුව), රාසලෙච්චිමි (දුව), නල්ලසියා (පුතා), පුස්පවල්ලි (දුව), නාගරාජා (පුතා) |
| J 11186—20.6.51 .. | පීටර් සේවියර් ස්තානිස්ලාවුස් ඩයස්, ගාබ්‍රියෙල් මිරන්ඩා සහ පුත්‍රයෝ බාරේ, මස්කෙළිය | මේරි ඉරුදයම් ලූවිසා (භාර්යාව), ජෝශප් බෙනඩික් වියනී (පුතා) |
| J 11205—30.7.51 .. | මුත්තුසාමි මායලගු, වනරාජා වතුයාය, දික්ඔය ... | සෝලෙයිඅම්මා (භාර්යාව), මුත්තුසාමි (පුතා), සෙල්ලම් (දුව), බාලක්‍රිෂ්නන් (පුතා) |
| J 11207—30.7.51 .. | මුත්තුසාමි පිච්චෙයි, නිව් වැලි වත්ත, නෝර්වුඩ් ... | අරුලායි (භාර්යාව), ෂන්මුගම් නොහොත් රායප්පන් (පුතා), ජානකිඅම්මා (දුව) |
| J 11400—22.7.51 .. | පෙරියන්නන් වේළු, වැලඩොලිඩ් කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | පච්චායි (භාර්යාව), සුබ්‍රමානියම් (පුතා), පෙරියන්නන් (පුතා), සිවලිංගම් (පුතා), අරියනාච්චි (දුව) |
| J 11580—22.7.51 .. | කිට්නන් දොරෙයිසාමි, බාර්ග්‍රොව් වත්ත, මස්කෙළිය | අම්ර්දම් (භාර්යාව), පොන්නයියා (පුතා), ගෝවින්දන් (පුතා), කාලියප්පන් නොහොත් අයියන් පෙරුමාල් (පුතා), ලෙච්චුමි (දුව), ආරන් (පුතා) |
| J 11740—29.7.51 .. | කුප්පන් තරුමන්, ග්ලෙනුගී වත්ත, මස්කෙළිය ... | අම්ර්දම් (භාය්‍යාව), කුප්පන් (පුතා), සිවසාමි (පුතා) |
| K 1238—10.12.50 .. | රාමන් රාමසාමි, හැඩ්ලි වත්ත, දික්ඔය ... | මාරියායි (භාය්‍යාව), මාරිමුත්තු (පුතා), සෙල්ලම්මා නොහොත් නාගම්මා (දුව), රෙන්ගසාමි (පුතා) |
| K 7261—6.5.51 .. | මායන්ඩි ලාඩන්, බ්‍රිඩ්වෙල් කොටස, බෝගවන වතුයාය, බෝගවන්තලාව | සින්නම්මාල් (භාය්‍යාව) |
| N 1428—2.8.50 .. | වයියාපූරි කොලන්දෙයිවේල්, මැද කොටස, දන්සිනේන් වත්ත, පුන්දුල්ඔය | මූක්කායි (භාය්‍යාව), නල්ලම්මා (දුව), පලනි නොහොත් කන්දයියා (පුතා), මුරුගන් නොහොත් මුරුගයියා (පුතා), ලෙච්චුමි නොහොත් පොන්නරුම්බු (දුව) |
| Q 564—23.9.50 .. | කදිර්වේල් මුත්තයියා, මිඩ්ල්ටන් වත්ත, තලවකැලේ | අම්ර්දම් (භාය්‍යාව), සින්නතුරෙයි (පුතා), සෙල්ලප්පා (පුතා), සුප්පයියා (පුතා) |
| R 5032—30.7.51 .. | සුබ්‍රමානියම් සුප්පයියා, උඩරදැල්ල වත්ත, නානුඔය | අම්මුනි (භාය්‍යාව), සිවරාමන් (ඥාති පුතා), මාරියායි නොහොත් මාරිඅම්මා (දුව), ආරායි (දුව), සුබ්‍රමානියම් (පුතා), වල්ලි නොහොත් සදයම්මා (දුව), ලෙච්චිමි (දුව), කන්දසාමි (පුතා), අයියකන්නු (පුතා) |
| X 5484—3.7.51 .. | වීරසාමි කෝවින්දන්, ක්‍රේග් වත්ත, බන්ඩාරවෙල | පොන්නාච්චි (භාය්‍යාව), නාරායනන් නොහොත් තන්ගවේළු (පුතා), නාගම්මා (දුව) |
| X 9190—3.8.51 .. | මාරප්පන් කේසවන්, පහළ කොටස, ක්‍රේග් වත්ත, බන්ඩාරවෙල | පෙරමායි (භාය්‍යාව) |
| O 7178/X—8.7.51 .. | මුත්තුසාමි මාරිමුත්තු, බන්ගලාව කොටස, වල්ඩෙමාර් වතුයාය, උඩපුස්සැල්ලාව | මාරියායි (භාය්‍යාව), මුත්තයියා නොහොත් සන්නාසි (පුතා), සෙල්ලයියා නොහොත් පලනියන්ඩි (පුතා) |

| ඉල්ලුම් පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| X 28933/Z/X—3.6.51 | මාරප්පන් කාලියන්නන්, ෂර්වුඩ් වත්ත, හපුතලේ | සෙල්ලායි (භාර්යාව), නල්ලම්මා (දුව), අන්ගම්මා (දුව), වින්ගලම්මා (දුව) |
| V 232/Y—29.11.50 .. | තනවරායර් උඩයප්පාපිල්ලෙයි මානික්කම්පිල්ලෙයි, කනනාදන් ස්ටෙ ෂ්, අංක 170, පහළ වීදිය, බදුල්ල | රාමායි (භාර්යාව), සාරතාම්බාල් (දුව), කනනාදන් (පුතා), තේවසුන්දරී (දුව), රාමනාදන් (පුතා), අරුනාගිරිනාදන් (පුතා), පාර්තුනන් (පුතා) |
| CC 1289—23.5.51 .. | සෝලමලෙයි කිට්නසාමි, නැගෙනහිර කොටස, එඩේර පොල්ල වතුයාය, බුලත්කොහුපිටිය | සුප්පම්මා (භාර්යාව), සෝලමලෙයි නොහොත් රාමයියා (පුතා), සන්දනම් නොහොත් තන්ගයියා (පුතා), කාමාච්චි (දුව), රාමන් (පුතා), ලෙච්චු මනන් (පුතා), සින්නම්මා (දුව) |
| C 5032/T/D—25.7.51 | කුමාරන් වඩිවේළු, අංක 153/2, ශ්‍රී වික්‍රම රාජසිංහ පාර, 4 වෙනි කුරන, මීගමුව | සුප්පම්මාල් (භාර්යාව), චන්ද්‍රවේළු (පුතා) |
| M 2282—25.6.51 .. | අලගන් අලගන්, ලෝංවිල් වත්ත, රත්තොට ... | ආරුමුගම් නොහොත් පෙරියම්බුලෙයි (පුතා), වල්ලී (දුව), අමරාවතී නොහොත් අලගම්මා (දුව), වේළුසාමි (පුතා) |
| M 3845—7.6.51 .. | සෙම්බන් මුත්තයියා, කරගස්තැන්න වත්ත, ගම්මඩුව | සින්නපිල්ලෙයි (භාර්යාව), කරුප්පයියා (පුතා), රාමයියා (පුතා) |
| M 3876—7.6.51 .. | පාම්බයන් මලයන්, කරගස්තැන්න වත්ත, ගම්මඩුව | රාමායි (භාර්යාව), අල්ලි (දුව), ආන්ඩි (පුතා), ආයි පුල්ලෙයි (දුව), ආන්ඩිච්චි (දුව), මලයන් (පුතා), ආන්ඩියම්මා (දුව), පාර්වතී (දුව) |
| M 4924—17.6.51 .. | පලනි වෙල්ලසාමි, ඇල්ලගල්ල වත්ත, රත්තොට ... | සින්න අලගි (භාර්යාව), තන්ගම්මා (දුව), සින්නයියා (පුතා), අලගම්මා නොහොත් පුල්ලී (දුව) |
| M 4974—17.6.51 .. | පිල්ලිකුට්ටි ආරුමුගම්, ඇල්ලගල්ල වත්ත, රත්තොට | මුනියම්මාල් (භාර්යාව), සොක්කලිංගම් නොහොත් වෙල්ලසාමි (පුතා), රාමලිංගම් නොහොත් රාසලිංගම් (පුතා) |
| M 4995—17.6.51 .. | කරුප්පන් වීරන්, ඇල්ලගල්ල වත්ත, රත්තොට | පූච්චිපිල්ලෙයි (භාර්යාව), මුත්තයියා (පුතා) |
| M 5015—17.6.51 .. | කුලයන් කරුප්පන්, ඇල්ලගල්ල වත්ත, රත්තොට | නල්ලම්මා (භාර්යාව) |
| M 5030—17.6.51 .. | පෙරමන් මුනියන්ඩි, ඇල්ලගල්ල වත්ත, රත්තොට | මුත්තායි (දුව), සෙලම්බායි නොහොත් අම්මකන්නු (දුව), සුප්පයියා (පුතා). |

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## තරඟයක්—පින්තූර මුද්දර මෝස්තරයක්

**සුදුසු යයි තෝරාගනු ලබන මෝස්තරය සඳහා ත්‍යාගය රුපියල් 500 යි**

ලංකාවේ පිරිවෙන් විශ්ව විද්‍යාල ආරම්භ කිරීම නිමිති කොට ශත 10යේ පින්තූර මුද්දරයක් නිකුත් කිරීමට තීරණය කොට තිබේ. මේ සඳහා විනිශ්චය මණ්ඩලයක් මගින් සුදුසු යයි තෝරා ගනු ලබන මෝස්තරය වෙනුවෙන් රුපියල් 500 ක මුදල් ත්‍යාගයක් පිරිනමනු ලැබේ.

2. මේ තරඟය සඳහා ඉදිරිපත් කරන මෝස්තර කොළඹ 1, (තැපැල් පෙට්ටිය 515) සෙනේට් චතුරශ්‍රයේ, මුද්දර, මුදල් බදු සහ ආදායම් බදු කොමසාරිස් වෙත යටත් පිරිසෙයින් 1959 ජූනි මස 9 වැනි අඟහරුවාදා වත් ලැබෙන සේ එවිය යුතුයි.

3. තරඟයට ඉදිරිපත් වීමට අදහස් කරන අයවලුන් විසින් පහත සඳහන් කරුණු සිත්හි තබා ගත යුතුයි:—

(අ) මුද්දරය නිකුත් කරනු ලබන්නේ 1960 ජනවාරි 1 වැනිදාට යෙදෙන පිරිවෙන් විශ්ව විද්‍යාලයන්හි ප්‍රථම සාංවත්සරික දිනයේ දී යි.

(ආ) බලාපොරොත්තු වන මෝස්තරයේ ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ පිරිවෙන් විශ්ව විද්‍යාලයන් පිහිටුවීම සිහිකිරීමයි.

(ඉ) වන්දනා මානන සටහන් කිසිවක් මෝස්තරයට ඇතුළත් නොවිය යුතුයි.

(ඊ) මුද්දරයේ ප්‍රමාණය 1½" × 1" කි. මෝස්තරය එකම ප්‍රමාණයට පිළියෙළ කළයුතු අතර එහි ප්‍රමාණය කොයිම අවස්ථාවකවත්, තැපැල් පතක ප්‍රමාණයට වඩා කුඩා නොවිය යුතුය. ඡායාරූපයක් පාවිච්චි කළහොත් එහි පිටපතක් එවීම ප්‍රයෝජනවත් වේ.

(උ) කඩදාසියක ඇලවූ විට දිග පැත්ත සෑජුව හෝ සමාන්තරව හෝ සිටින සේ මෝස්තරය පිළියෙල කළ යුතුය.

(ඌ) මෝස්තරයට නමක් දිය යුතුය. එය කුඩා සිංහල අකුරෙන් සටහන් විය යුතුය.

(එ) "ශ්‍රී ලංකා" යන්න සිංහලෙන්, දෙමළෙන් සහ ඉංගිරිසියෙන් යෙදීම සඳහා ඉඩ වෙන්කර තැබිය යුතුය.

(ඒ) "තැපැල් ගාස්තුව සහ ආදායම්" යන වචන සිංහලෙන් යෙදීම සඳහා ඉඩ වෙන්කර තැබිය යුතුය.

(ඔ) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංගිරිසියෙන් මිළ සඳහන් කිරීම සඳහා ඉඩ වෙන් කර තැබිය යුතුයි.

(ඕ) මෝස්තරය පාට දෙකකින් විය යුතුය. මේ පාට දෙක මෝස්තරය සම්පාදක ගේ කැමැත්ත පරිදි තෝරා ගත හැකිය.

(ඇ) ඉදිරිපත් කරන මෝස්තර විනිශ්චය කරනු සඳහා පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලය පිළිගන්නා එක්තරා තත්ත්වයකින් නොතිබුණහොත්, මෝස්තරය සඳහා වූ ත්‍යාගය ප්‍රදානය කරනු නොලැබේ.

(ඈ) ත්‍යාගය හිමිවන මෝස්තරය ආණ්ඩුවේ දේපළක් බවට පැමිණේ.

(ක) විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

4. මෝස්තර ඉදිරිපත් කරන විට "මුද්දර මෝස්තර" යන වැ'කිය සටහන් කළ ලියුම් කවරවල බහා, කොළඹ 1, සෙනේට් චතුරශ්‍රයේ, ආදායම් බදු දෙපාර්තමේන්තුවේ විමසිලි පිළිබඳ කාර්යාලයයට ලැබෙන මෙන් තැපැලෙන් හෝ නැතහොත් අතින් ගෙනැවිත් හෝ භාර දිය යුතුය.

ඇල්. ජී. ගුණසේකර,
මුද්දර, මුදල් බදු සහ ආදායම් බදු කොමසාරිස්.

1959 මැයි මස 9 දින.

## 1958 සම්මාන සාහිත්‍ය ත්‍යාග

### ලේඛකයන් හා ප්‍රකාශකයන් වෙත දැනුම්දීමයි

(1) ප්‍රබන්ධ (නවකතා හෝ කෙටිකතා).

(2) කාව්‍ය (දෘශ්‍ය කාව්‍ය හෝ ශ්‍රව්‍ය කාව්‍ය).

(3) විචාර (සාහිත්‍ය විචාරය).

(4) සංස්කරණ (පැරණි සිංහල සාහිත්‍ය කෘතීන් ව්‍යවහාර භාෂාවෙන් ලිවීම හෝ බාහිර සාහිත්‍ය කෘතීන් සිංහලෙන් ලිවීම).

යන ඉහත සඳහන් කාණ්ඩ හතර යටතේ 1958 අවුරුද්ද තුළ පළ වුණු හොඳම පොත් අටක් සම්මාන සාහිත්‍ය ත්‍යාග පිරිනැමීම සඳහා තෝරාගනු ලැබේ. මෙම කාණ්ඩ හතර යටතේ 1958 දී පොත් ලියන ලද ලේඛකයන් හා/හෝ පොත් පළ කළ ප්‍රකාශකයන් එම පොත් පිළිබඳ සම්පූර්ණ විස්තර 1959 ජූනි මස 5 වැනි දිනට පෙර මා වෙත එවනු මැනවි. විස්තර එවන විට හැකි නම් එවැනි මුද්‍රිත පොත්වල පිටපත් දෙක බැගින් ද එවුවහොත් කෘතඥ වෙමි.

ලිපියොමුව : සංස්කෘතික අධ්‍යක්ෂ,
135, වරච් පාර,
කොළඹ 7.

ආර්. කජු. දියෙස්,
සංස්කෘතික අධ්‍යක්ෂ.

1959 මැයි මස 15 වැනි දින.

---

## 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

වර්ෂ 1952 ප්‍රකාශයට පමුණුවන ලද තිස්සමහාරාම වන්දනා රෙගුලාසිවල අංක 3 දරණ රෙගුලාසිය අනුව හම්බන්තොට වැඩ බලන දිසාපති තැන්පත් පී. සිවඥානම් වන මම පහත සඳහන් දිනයන් 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බල පවත්වන කාලසමයන් වන බැව් මෙයින් ප්‍රකාශ කරමි.

### 1959 පොසොන් උත්සවය

1959 ජූනි 19 දින සිට 22 දින දක්වා (දින දෙක ඇතුළත්ව).

පී. සිවඥානම්,
හම්බන්තොට වැඩබලන ආණ්ඩුවේ දිසාපති.

1959 මැයි 8,
හම්බන්තොට කච්චේරියේදිය.

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ කරඹෑව පත්තුවේ මෙරුන්ගොඩ ගම්මුලාදැනි වසමේ මෙරුන්ගොඩ ගමෙහි ගවයන් අතර "හෙමරේජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : අලන්කුලම ගම්මුලාදැනි කොට්ඨාශය.
දකුණට : කරඹෑව ගම්මුලාදැනි කොට්ඨාශය.
නැගෙනහිරට : කෝසිලන්දිගම පළාත.
බස්නාහිරට : වන්නි හත්පත්තුව.

2. මෙම ආඥාපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්බන්ධ කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පුත්තලමේ පශු වෛද්‍ය තැනගෙන් හෝ ආණමඩුව පළාත කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කායසීලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4 මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 මැයි මස 13 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැනගේ කායසීලය,
පේරාදෙණිය.

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ කරඹෑව පත්තුවේ කරඹෑව ගම්මුලාදැනි වසමේ කරඹෑව ගමෙහි ගවයන් අතර "හෙමරේජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : තල්ගස්වැව.
දකුණට : අලන්කුලම සහ මෙරුන්ගොඩ.
නැගෙනහිරට : කරඹෑව කැලය.
බස්නාහිරට : ගල්ලෑව.

2. මෙම ආඥාපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්බන්ධ කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පුත්තලමේ පශු වෛද්‍ය තැනගෙන් හෝ ආණමඩුව පළාත කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කායසීලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 මැයි මස 13 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කායසීලය,
පේරාදෙණිය.

---

## "කුර සහ මුව" රෝගය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ දෙනවක, උඩකඩ යන ගම්වල ගවයන් අතර "කුර සහ මුව" රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 පෙබරවාරි මස 13 වැනි දින අංක 11,664 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 මැයි මස 12 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කායසීලය,
පේරාදෙණිය.

---

## "කුර සහ මුව" රෝගය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුරුවිට වසමේ ගවයන් අතර "කුර සහ මුව" රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපණතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ ජනවාරි මස 30 වැනි දින අංක 11,655 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයා වෙත දන්වමි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 මැයි මස 12 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කායසීලය,
පේරාදෙණිය.

## විශෙෂ නිවේදනයයි

1959 ජූනි මාසයේ සිට, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, ඊට කලින් සතියේ සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙනසේ එවිය යුතුවේ. සඳුදාත් සිකුරාදාත් අතරතුරදී ආණ්ඩුවේ නිවාඩු දිනයක් යෙදෙන්නේ නම් (දෙදිනම ඇතුළුව) එම දැන්වීම් සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මැයි 15 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේදීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී